

# රහතුන්ගේ කරච්චලේ

කරච්චලේ කියන පදය හරි නැත. විශේෂයෙන් රහතුන් බඳු පරාණකාරයන් පිරිසක් ගැන කියනකොට. ඒත් මට ඊට වඩා හොඳ වචනයක් හිතා ගන්නට බැරිය. හිතට එන එකම පදය කන්දොස්කරියාවය. එය ඔබින්නේ නාකි අම්මණ්ඩිලා ගැන කියන්නටය. කොන්ද අත ගගා කෙඳිරි ගානා නාකි උන්දැලා. රහත්තු එසේ නොවෙති. අභීත සිංහ ගර්ජනාවෙන් රට පුබුදු කරන්නෝය. වෙනත් වචනයෙන් කියතොත් රට දෙවනත් කරන්නෝය. පුංචි පහේ රටක් නොවේ. මේ මිහිතලය මත පිහිටි එකම දහම් දිවයින ය.

මගේ "සිංගරු සිරිතේ" එක් පරිච්ඡේදයකට මා නම යෙදුවේ "ෆ්ලයි ඉන් ෆ්ලයි අවුට් බණ" යනුවෙනි. මේ රටේ දුර බැහැර පළාත්වල සේවය කරන සේවකයන් සති දෙකකට පමණ වතාවක් පිට පළාත් වල සිට සිට ගුවන් මගින් අරන් එන ක්‍රමය හඳුන්වන්නේ ඒ අපූරු නමින්ය. ඒ විදියටම පිටතින් ගුවන් මගින් ගෙන්වා බණ කියවා ගැනීමේ සිරිතක් එක් ප්‍රාන්ත නගරයක පැවතියේය. එසේ පැමිණි භික්ෂුවක් සිය ගුරු හිමියන් ගැන වර්ණනා කර ඇත්තේ උන්වහන්සේ සෝවාන් වුවකු බව නොකියා කියමිනි. මට මේ පුවත කී මිතුරාගේ කට වචනය ප්‍රමාණවත් නොවන නිසා පටිගත කර එවන්නැයි ඉල්ලා සිටියෙමි. ඒ කාරිය ඉටු නොවූ නිසා මට ඒ ගැන හරියට කීමට බැරිය. මා දන්නා තරමින් කලකට උඩ මෙල්බර්න් පන්සලකට ආ උවැසියන් දෙනෙකු සෝවාන් වූවන් බව කියපු කතාවක් මා අසා ඇත. ඒ කතාවද දැන් යටපත්ව ඇත .

සෝවාන් වූවන් වැහි වැහැලා ඇත්තේ ශ්‍රී ලංකාවේය. වේවැල්දෙණියේ කාර්යාලයකින් සෝවාන් සහතික නිකුත් කරන බව නිවේදනය කරන පුවත්පත් දැන්වීමක් මම කියෙව්වෙමි. ඒ අනුව සෝවාන් කාරයන් සැලකියයුතු සංඛ්‍යාවක් රට තුළ සිටින්නටද ඉඩ ඇත . ඔවුන් දේශපාලකයන්ගේ පුද්ගලික ලේකම් බඳු තනතුරු දරතොත් එයද පුදුමයට කරුණක් නොවනු ඇත .

මගේ "සිංගරු සිරිතෙහි" රහත් වූ කාන්තාවක ගැනද කියා ඇත . මහව පළාතේ සිටියා වූ ඇයගේ රහත් අසනීපය සුවකරන ලද්දේ මනෝචිකිත්සකයකු විසින්ය. රහත් බව ලත් උපාධිධාරී කාන්තාවක යටතේ මහණ දම් පිරීමට ආ තවත් උපාධිධාරී කාන්තාවකගේ මුළු සේසතම තමා නමට ලියවාගෙන හිටි හැටියේම "රහත් වූ" කතක ගැන පුවත්පත්වල පළ වූයේ දැනට වසර කීපයකට උඩදීය.

මා සෝවාන්කාරයා යන පදය යෙදුවේ හිතා මතාය. ඉස්සර අපට පත්තර හා කිරි අරන් ආපු බයිසිකල්කාරයන් හඳුන්වන ලද්දේ පත්තරකාරයා සහ කිරිකාරයා යන නම්වලිනි. ඒ අනුව යමින් මම වර්තමාන සෝවාන් වූවන්ට හා නව රහතුන්ටත් සෝවාන්කාරයා සහ රහත්කාරයා යන නම් භාවිතා කරමි.

දැන් සිරිලක්දිව හෙල්ලුම්කවන නවතම රහත්කාරයා ගැන කියමි. ඔහු කරච්චල්කාරයකු ලෙසින් මා දකින්නේ පුවත්පත් මගින් හා අන්තර්ජාලයෙන් ඔහු කරන අඬබෙර ගැහිල්ල නිසාය. තමා සමග වාදයට එන්නැයි තමන්ට අභියෝග කරන සැමදෙනාටම කියා සිටින ඒ රහත්-ධර හාමුදුරුවන් එකක් නම් නොකරන බව සහතිකය. ඒ උඩු ගුවනින් ගමන් කොට පෙළහර පෑමය. ගුවනින් වඩිනා තාපසයන් බලනු වස් වතුර කොරහක් මිදුලේ තබාගෙන එයට මූණ ඔබාගෙන හිටපු උපාසිකාවන් ගැන මා අසා ඇත . දැන් එහෙම වැඩපු තාපසයන් ද ආගිය අතක් නැත .

නව රහත්ධරයා එසේ මෙසේ කෙනෙක් නොවෙති. විද්‍යාධරයෙකි. පරණ තේරුමට නොව විද්‍යා උපාධිධරයා යන තේරුමටය. වරක් අපාය ගැන උන්වහන්සේ කර තිබුණ විග්‍රහය ගැන මම පැහැදුනෙමි. ඒ බව මගේ පොතකද සඳහන් කර ඇත . එහෙත් මා පුද්ගල වන්දනාව පුරුදුකරුවකු නොවන නිසා මට පුද්ගලයකුගේ අදහසක් මට රිසි අයුරින් විමසා බලන්නටත් මගේ මතය කියන්නටත් හයියක් ඇත .

ඔය කියන හාමුදුරුවන් මං වගේ මහල්ලකු අල්ලා ගෙන වාද කිරීමට නොසිතන බවට මට සහතිකය.

යළිත් අර පෙළහරපෑම ගැන කියමු. බුදු හාමුදුරුවන් මාතෘදේවරාජයන්ට බණ කීමට දෙව්ලොවට වැඩම කළේ ගණ්ඩබ්බ .. පෙළහරපෑමෙන් අනතුරුවය. එසේ කළේ ද සිය සව්වන්ට පෙළහර පෑම තහනම් කරලාය. ඉන් පසු කිසිදු රහත් නමක් පෙළහර පෑ බවක් වාර්තා වී නැත . ඒ නිසා මේ නව රහත්කාරයාගෙනුත් ඒ ක්‍රියාව බලාපොරොත්තුවීම හරි නැත. ශ්‍රී ලාංකික රහතුන්ටත් ඒ වාගේ ශ්‍රාවක පිරිසක් ඇති කරගතහොත් ලෙදලොවටම කෙසේ වෙතත් මෙලොවට වැඩක් කර ගත හැකි බව නම් කිව හැකිය.

මම බුදු බණ පිළිබඳ විශාරදයෙක් නෙවෙමි. මගේ නැණ පමණින් වටහා ගත් දහමක් මම පිළිපදිමි. ඒ නිසා මිලිඳු රජුන්ගේ තැනට නගින්නට මට බැරිය. මට එය වුවමනාද නැත . එහෙත් මම එකක් විශ්වාස කරමි. ඒහි පස්සිකෝ කියන බුදු වදන විමසා බලා වටහා ගැනීමට හැම කෙනෙකුටම අයිතියක් - නිදහසක් ඇති බව මම අදහමි. කට මැත දොඩන කාගේ වුවත් කීමක් විමසා බැලීමට මම පසුබට නොවෙමි.

බණ දෙසන්නා පමණක් නොව ඒ අනුගමනය කරන්නාද සිය දිවිය ගත කළ යුත්තේ තමාට වාගේම අනුන්ටත් වැඩක් සිදුවන ආකාරයට බව




මම තරයේ විශ්වාස කරමි. හුදෙක් අත පොරවාගෙන බලා සිටීම බොදු පිළිවෙත නොවිය යුතුය. කුරා කුහුඹියකුට වත් වරදක් නොකර ජීවත්වීම ප්‍රමාණවත් නොවන බව ය මා සිතන්නේ.

අහෝ එසේ කරන පුද්ගලයන්ගේ එක හොඳක් මම දකිමි. ඔහු තමාගේ දැසැහැවත් චරියාව නිසා අන් අයට හිරිහැර නොකර සිටිනා එකය. අන්න් යන මග ගැටීමට වලිකන මිනිසුන් හැම තැනම සිටින සමාජයක එබඳු අහිංසකයන් දක්නට ලැබීම ද සහනයකි.

එහෙත් එබන්දන් අයත් වනුයේ - අයත් විය යුත්තේ - බුදු බව පතන කොටසටය. තමන්ගේ පාඩුවේ කරබාගෙන නිවනට යන උඩවියටය. එබන්දෝ කරච්චල්කාරයෝ නොවන්නාහ. සෙසු ජනයාට නිවී සැනසිල්ලේ තමන්ගේ වැඩක් පළක් කරගෙන ජීවත් විය හැකිය.

ශ්‍රී ලංකාවේ බුදු සසුන අද පත්ව සිටින තත්වය අනුව තමන් රහත් වු බව කියමින් වහසි බස් දොඩන්නේ ඉදිරියේ යටත් පිරිසෙයින් සඟ සසුනවත් (අර බෙංගමුවේ නාලක හාමුදුරුවන් කියා තිබුණ ආකාරයට) සසුන කන කඳ පණුවන් තුරන් කිරීම වැදගත් රාජකාරියකි.

## ප්‍රශ්න අපෙන් - උත්තර ඔබෙන්

### මෙන්න අද ප්‍රශ්න

**මර්වින් සිල්වා නැවත කැළණිය සංවිධායක ලෙස පත්කිරීම**

1 ජනමතය පිළිබඳ ජනාධිපතිවරයාගේ තක්සේරුව පෙන්වා දෙන සිදුවීමකි
2 වෙඩි කා මළ මඩවල නාගරික මන්ත්‍රිවරයාට කළ ගෞරවයකි
3 කැළණිය ජනතාවට සුදුසුම මේ වර්ගයේ අයකු බව පෙන්වා දීමකි
4 කැළණියේ කප්පම්කාරයන්ට කළ අභියෝගයකි

**තමන්ගේ ගෝලබාලයන් ප්‍රසිද්ධියේ කුඩු ගෙන්වා අසුවෙද්දී ජනාධිපතිතුමා නොදැක්කා සේ සිටින්නේ**

1 මතට තිත තබන්නටය
2 තිතට මත තබන්නටය
3 එතුමාගේ දරුවන් කුඩු නොගසන නිසාය
4 මහජනතාවට කුඩු අත්‍යවශ්‍ය නිසාය

**නිළියන් තොග ගණනින් දේශපාලනයට පැමිණීම**

1 දැන් පාර්ලිමේන්තුවේ ඉන්නා හොරුනට වඩා ඒ අය වැදගත් ය
2 ඒ අයට හංගාගන්නට දෙයක් නැති නිසා විවෘතය
3 පාර්ලිමේන්තුවේ දැන් ඉන්නා උන්ගේ පවුල් කැඩෙන වැඩක්ය
4 කෙහෙළියට තරු විසිවෙන වැඩකි

**රෝහිත රාජපක්ෂගේ සපත්තු කුට්ටම රුපියල් එක්ලක්ෂ පනස්දාහක් වෙතැයි තිස්ස අත්තනායක කියයි. එතරම් මිල අධික සපත්තු පුතාට අරගෙන දුන්නේ**

1 බලයට ආ විට තිස්සගේ පුතාට එයට වඩා වටිනාකමැති පසත්තු අරගෙන දෙන්නට ඉඩ ලබාදෙන්නටය
2 කෝටි ගණනක් වටිනා ලැම්බෝගිනියක් සෙරෙප්පු කුට්ටමක් දාගෙන පදවන්න බැරි නිසාය
3 ජාතියේ ආඩම්බරකාර තාත්තලාගේ හැටි එහෙම නිසාය
4 නාස්තිකරන්නට තරම් මහා ධනස්කන්ධයක් එතුමාට ඇති නිසාය

**සෝමවංස සහෝදරයාට මේ දවස්වල නින්ද නොයන්නේ**

1 නායකත්වයට තට්ටු වූ නිසාය
2 රජය කරගෙන යන ජනතා විරෝධී ක්‍රියා නිසා ලේ කෝප වී ඇති නිසාය
3 පළාත් සභා ඡන්දයේදී සිදු වන දේ කල් තියා දැනෙමින් ඇති නිසාය
4 මේ දවස්වල රස්නෙ වැඩි නිසාය

**අවවාදයයි**
**නිවැරදි පිළිතුරු සොයාගත්තොත් ළඟම යහලුවාට පමණක් කියන්න**

**αlpha academy**

Primary, Secondary ,VCE

2014 **Program - Enrollments open**

| | |
|---|---|
| Primary & Secondary | - Mathematics, Science and English |
| VCE | - Biology, Chemistry |
| VCE English | - Recommended Texts, Analytical Writing |

Classes conducted by Current School Teachers

**Contact - Sarah on 0457908918**
ABN 52267352093